<u>මුලතිව් දිස්ත්‍රික්කයේ ආපදාවට ලක්විය හැකි ප්‍රදේශ</u>

**අ. වැව් පිටාර ගැලීමෙන් ඇතිවිය හැකි ආපදා තත්වයන් හේතුවෙන් ආපදාවට ලක්විය හැකි භූමි ප්‍රමාණය/වගාබිම් ප්‍රමාණය හා පවුල් සංඛ්‍යාව.**

| අඅ | වැවේ නම | වාන් මට්ටම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ප්‍රදේශය/ ග්‍රාමසේ වාවසම | ආපදාවට ලක්විය හැකි සම්පූර්ණ භූමි ප්‍රමාණය | වගාබිම් ප්‍රමාණය | ආපදාවට ලක්වන පුද්ගලයින් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | පවුල් | පුද්ගලයි න් |
| 1 | මුරිප්පු | අඩි 12.6 | මුහුදුබඩපත්තු | එම්යු 118 කුමාරපුරම් | - | අක්: 14 | 34 | 113 |
| 2 | නන්දිකඩාල් කඩාල් කලපුව | - | මුහුදුබඩපත්තු | එම්යු 102 කේපාපිලව් | කලපු සීමාවේ සිට කි.මී 02 ක් පමණ | අක්:15 | - | - |
| 3 | කිරිඉබ්බන් වැව | අඩි 18 | වැළිඔය | කිරිඉබ්බන්වැව | අක්: 100 | අක්: 300 | 03 | 09 |
| 4 | ඇහැටුගස් වැව | අඩි 18 | වැළිඔය | ඇහැටුගස්වැව | අක්: 70 | අක්: 306 | - | - |
| 5 | හැළඹවැව | අඩි 18 | වැළිඔය | හැළඹවැව | අක්: 15 | අක්: 35 | - | - |
| 6 | මුතියන්කට්ටු වැව | අඩි 24 | ඔඩ්ඩුසුඩාන් | එම්යු 55 මුතියන්කට්ටු | අක්: 4800 | අක්: 4000 | 249 | 850 |
| 7 | වව්නිකුලම් වැව | අඩි 27 | මැන්තේ (නැ) | එම්යු 06 පාලිනගර් සහ එම්යු 05 ශිවපුරම් | අක්: 90 | අක්: 50 | 25 | 105 |
| 8 | උඩයාර්කට්ටු වැව | අඩි 23.1 | පුදුකුඩිඉරිප්පු | එම්යු 46 උඩයාර්කට්ටු (ද) | අක්: 40 | අක්: 1270 | - | - |
| 9 | ඉඩෙක්කට්ටු වැව | අඩි 10 | පුදුකුඩිඉරිප්පු | එම්යු 46 උඩයාර්කට්ටු (ද) | රක්ෂිත භූමියකි | රක්ෂිත භූමියකි | - | - |
| 10 | මරඳමඩු වැව | අඩි 14.02 | පුදුකුඩිඉරිප්පු | එම්යු 45 වල්ලිපුනම් | අක්: 10 | අක්: 350 | - | - |

**ආ. වෙනත් හේතූන් මත (අධික වැසි ජලය එක්රැස්වීම හේතුවෙන්) ඇති වන ජල ගැලීමකදී ඇතිවිය හැකි ආපදා තත්වයන්:**

| අඅ | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ප්‍රදේශය/ ග්‍රාමසේවා වසම | ආපදාවට ලක්විය හැකි සම්පූර්ණ භූමි ප්‍රමාණය | වගාබිම් ප්‍රමාණය | ආපදාවට ලක්වන පුද්ගලයින් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | | | | | පවුල් | පුද්ගලයින් |
| 01 | මුහුදුබඩපත්තු | එම්යු 120 තන්නිමුරිප්පු | අක්: 150 | අක්: 150 | - | - |
| 02 | මුහුදුබඩපත්තු | කල්ලපාඩු (ද) | අක්: 01 | - | 10 | 25 |
| 03 | මුහුදුබඩපත්තු | එම්යු 81 කොක්කුතුඩුවායි (උ) | අක්: 575 | අක්: 600 | 50 | 80 |
| 04 | මුහුදුබඩපත්තු | එම්යු 78 කෝකිලායි (නැ) | අක්: 120 | - | 150 | 250 |
| 05 | වැළිඔය | ජනකපුර | - | අක්: 20 | 35 | 105 |
| 06 | | එම්යු 58 පණ්ඩාරවන්නි | අක්: 350 | අක්: 85 | 32 | 102 |
| 07 | ඔඩ්ඩුසුඩාන් | එම්යු 66 කරුවලකන්ඩල් | අක්: 8 | අක්: 4 | 4 | 16 |
| 08 | | එම්යු 67 පුලියන්කුලම් | අක්: 15 | අක්: 10 | 4 | 12 |
| 09 | තුණුක්කායි | එම්යු 17 කල්විලාන් | අක්: 15 | අක්: 7 | 6 | 21 |
| 10 | පුදුකුඩිඉරිප්පු | සුගන්ධිරපුරම් | - | - | 17 | 40 |
| 11 | පුදුකුඩිඉරිප්පු | උඩයාර්කට්ටු (උ) | - | - | 13 | 18 |

ඇ. ආපදාවට ලක්විය හැකි පුද්ගලයින් රඳවා තැබීමට යොදා ගන්නා සහන මධ්‍යස්ථාන:

(1) කොක්කුතුඩුවායි මහා විද්‍යාලය, කෝකිලායි ශාන්ත ආනා දේවස්ථානය, කෝකිලායි සිංහල විද්‍යාලය සහ හැළඹ වැව ශ්‍රී වැලිමළුව විහාරය භාවිතා කරනු ලබයි.

(2) කරුවලකණ්ඩල් ප්‍රාථමික විද්‍යාලය සහ මුත්තුවිනායාගපුරම් දකුණු ඉවුර රජයේ දමිළ මිශ්‍ර විද්‍යාලය භාවිතා කරනු ලබයි.

(3) පුදුකුඩිඉරිප්පු මධ්‍ය විද්‍යාලය, සුගන්ධිරපුරම් විද්‍යාලය සහ මුංගිල්ආරු පොදු මණ්ඩපය භාවිතා කරනු ලබයි.

ඈ. හදිසි ආපදා තත්වයකදී බල ප්‍රදේශයේ රාජ්‍ය අංශ/ ආරක්‍ෂක අංශ මැදිහත්වීම සබැඳි සැලසුම් කර ඇති ක්‍රියාමාර්ග:

(1) මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්ය හා මුහුදු බඩපත්තු ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් හදිසි අපදා තත්වයකදී ඒ සඳහා යොමුවිය යුතු නිලධාරීන් කණ්ඩායමක් පත්කර ඇති බවත්, ඔවුන් හට එවැනි කටයුත්තදී ගත යුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳව දැනුවත් කිරීමද සිදුකර ඇත.

(2) ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින්, ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ රාජ්‍ය ආයතන, ආපදා කළමනාකරණ අංශ, මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාල නිලධාරීන්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව නිලධාරීන් හා ඔඩ්ඩුසුඩාන් පොලිස් ස්ථානාධිපති සහ ඔඩ්ඩුසුඩාන් යුධ හමුදා කඳවුරේ නිලධාරීන් විසින් ඇතිවිය හැකි ආපදා තත්වය පිළිබඳ සාකච්ඡා කර ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කිරීම.

ඉ. ආපදා තත්වයන් වලක්වා ගැනීම සඳහා ඔබ වෙතින් ඉදිරිපත් කරන යෝජනා/ අදහස්:

(1) වර්ෂාව ඇති වන විට ජලය ගලා බසින ප්‍රදේශයන් ආශ්‍රිතව වගාබිම් ආරම්භ කිරීම/ ගොඩනැගිලි ඉදිකර ගැනීම සිදු කිරීමේදී එවැනි ක්‍රියාවන් වැලැක්වීමට කටයුතු කිරීම.

(2) ජලය ගලා බසින ස්ථාන හැකි සෑම අවස්ථාවකම සුද්ධ පවිත්‍ර කරවීමට කටයුතු කිරීම ඒ සඳහා නිසි පුද්ගලයින් පත්කර ක්‍රමවේදයක් සැලසීම.

(3) කලපු ආශ්‍රිත ප්‍රදේශයන් නිරතුරුව ඛාදනයට ලක්වීමෙන් සිදුවල ජල ගැලීම් අවම කර ගැනීම සඳහා ස්ථිර ගල්වැටි/ කඩොලාන ශාක සිටුවීමට කටයුතු කිරීම.

(4) දීර්ඝ කාලීනව සුද්ධ පවිත්‍ර හෝ ප්‍රතිසංස්කරණය කර නොමැති වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම.

(5) අනවසර වැලි ගොඩ දැමීම් නැවැත්වීමට ක්‍රියාමාර්ග ගැනීම.